# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 672/16—1991 ජූලි 25 වැනි බ්‍රහස්පතින්ද—1991.07.25

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.—බී. 21/78 III.

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 23 වන වගන්තියේ (2) වන උපවගන්තිය සමග කියැවියයුතු 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

සී. එස්. කරුණාරත්න මහත්මිය,
ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1991 ජූලි මස 22 වන දින,
කොළඹ දීය.

### නියමාවලිය

1990 ජනවාරි මස 5 වන දින අංක 591/18 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1990 අංක 1 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල නියමාවලියේ 18 වන ඡේදයේ (2) වන අනුඡේදය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) අනු ඡේදයේ (V) වන වගන්තියේ '' ඔවුන් අතුරෙන් තෝරා පත්කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙක් ; සහ '' යන වචන වෙනුවට, '' ඔවුන් අතුරෙන් තෝරාපත්කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙක් ;'' යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ අනු ඡේදයේ (VI) වන වගන්තියේ '' තැනැත්තන් සංඛ්‍යාවක් ; යන වචන වෙනුවට, '' තැනැත්තන් සංඛ්‍යාවක් ; සහ '' යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ අනු ඡේදයේ (VI) වන වගන්තියට ඉක්බිතිවම, පහත දක්වෙන අළුත් වගන්තිය ඇතුලත්කිරීමෙන් :—

''(VII) පීඨයේ ශිෂ්‍යයන් විසින්, ඔවුන් අතුරෙන් තෝරාපත්කරගනු ලබන ශිෂ්‍යයන් දෙදෙනෙක්.''.

මෙ නියමාවලිය මඟින් 1990 අංක 1 දරන ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල නියමාවලියට කරන ලද සංශෝධනය 1991 ජූලි මස 20 වන දින ක්‍රියාත්මක විය යුතුයි.

08—409


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1 A—D 15940-1,075 (91/07)